මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

වාර්ෂික වාර්තාව

2021

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

ආයතනික පසුබිම

ආයතනය	:	මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
අමාත්‍යාංශය	:	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලිපිනය	:	354/2, 7 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05
ඊ මේල් ලිපිනය	:	director.nhrdc@yahoo.com
වෙබ් අඩවිය	:	www.nhrdc.gov.lk
දුරකථන අංකය	:	0112595680
ෆැක්ස්	:	0112595680
විගණකවරු	:	විගණකාධිපති ජාතික විගණකාධිපති කාර්යාලය බත්තරමුල්ල
බැංකුකරුවන්	:	ලංකා බැංකුව මහජන බැංකුව

දර්ශනය

“අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්”

මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායී ප්‍රතිපත්ති හා නවීකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

අගයන්

- සාමූහිකත්වය
- නිර්මාණශීලිත්වය
- පාරිභෝගික නැඹුරුතාව
- සමානාත්මතාව

සභාපතිතුමාගේ ප්‍රකාශය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිණිස වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම උදෙසා 1997 අංක 18 දරණ ජාතික මානව සම්පත් සංවර්ධන සභා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ආයතනයකි. සභාවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අදාළ අමාත්‍යාවරයාට සහ රජයට මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා උපදෙස් ලබා දීමයි.

"සෞභාග්‍යයේ සහ ආශ්චර්යයේ දැක්ම" ට අනුකූලව මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සහ සකස් කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියේ සැලැසුම් කෙටුම්පත (Blue Print) සකස් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක කමිටුවක් සහ ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගෙන ඇත.

උපාධි යෝජනා ක්‍රම යටතේ බඳවා ගන්නා සංවර්ධන නිලධාරීන් ඵලදායී ලෙස යොදවා ගැනීම

ඔවුන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා වන නිර්දේශ යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ බැවින් මෙම අධ්‍යයනයේ වැදගත්කම සභාව විසින් හඳුනා ගන්නා ලදී.

රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරි තනතුරු හිඟය අවම කිරීම සඳහා ගැටලු සහ විසඳුම්/ නිර්දේශ හඳුනාගැනීම

මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වුයේ දැනට පවතින තාක්ෂණික නිලධාරී තනතුරු හිඟය සහ රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරී තනතුරුවල පවතින හිඟය වැඩිවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධක හඳුනා ගැනීමයි. පර්යේෂන වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දී ඇති අතර ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

එසේම, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂඥ සංචිතයක්, උපදේශකයින් සහ කමිටු පත්කර ගැනීමට සභාව විසින් පියවර ගෙන ඇත. සභා පනත මගින් සපයා ඇති පරිදි සහ අවශ්‍ය විටෙක සහ අවශ්‍ය පරිදි ඔවුන්ගේ සේවය ලබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණයි.

ඉහත කරුණු වලට අමතරව, සභාව විසින් අදාළ පාර්ශ්වකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම සඳහා වාර්ෂිකව සංඛ්‍යාන අත්පොතක් සහ මානව ප්‍රාග්ධන සහරාවක් ප්‍රකාශයට පත් කරයි. නවතම සංඛ්‍යාන අත්පොත සහ මානව ප්‍රාග්ධන සහරාව සභාවේ වෙබ් අඩවියේ පළකර ඇත.

චින්තක එස්. ලොකුහෙට්ටි
සභාපති

පටුන

1.ආයතනික පසුබිම හා විෂය පථය 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය 4

3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන 7

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු 8

5. 2021 වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති 12

5.1 2020/21 උපාධි යෝජනා ක්‍රමය යටතේ පත් කරන ලද සංවර්ධන නිලධාරීන් ඵලදායී ලෙස යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනය 12

5.2 රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය අවම කිරීම සඳහා ගැටළු හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය .. 13

5.3 ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (NHRDP) සැකසීම 16

5.4 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත 19

6. 2021 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සිදුකරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන 19

7. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 20

8. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය 22

9. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 23

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 24

11. සටහන් 25

12. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් 31

සමන්විත සටහන් 31

13.විගණන වාර්ථාව 34

1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනයෙහිලා සියලු කටයුතුවලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමටත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා උපදෙස් අදාළ අමාත්‍යවරයාට සහ රජයට ලබා දීමයි.

1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. එතැන් සිට කෙටි කාලයක් තුළදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී එය අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතටද ඉන්පසු නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයේද, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පාලනයටද නතු විය. මෙසේ කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කළ මෙම ආයතනය, වර්තමානයේදී රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යයි.

1.2 දර්ශනය

‘‘අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්‘‘

1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

1.4 අරමුණු

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණු වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි.

සභා පනතේ 14(1) වගන්තියට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත පරිදි වේ. පහත දැක්වෙන කාරණාවලට එනම් -

i. (අ) රැකී රක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය
   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම
   (ඇ) ජීවන තත්වය නංවාලීම
   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ
   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශවලින් අමාත්‍යවරයාට උපදෙස් දීම

ii. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iii. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට, සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iv. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම

v. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ

vi. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියලු ක්‍රියා සිදුකිරීම

1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාළව කාරණා සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතුවල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභාවලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට. සහ

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට.

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව *1997* අංක *18* දරණ ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභා පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයින් විසි දෙනෙකුගෙන් සමන්විත වේ. ඔවුන් අතරින් පහළොස් දෙනෙකු (15) නිල බලයෙන් පත් කරනු ලබන අතර ඉතිරි සාමාජිකයින් පස් දෙනා (5) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. අදාළ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ කුසලතා සලකා එම සාමාජිකයින් පස්දෙනා පත් කර ඇති අතර ඉන් දෙදෙනෙකු (2) පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තවූවන් ය. කෙසේ වෙතත්, නිලබලයෙන් පත්වන සාමාජිකයින් සංඛ්‍යාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44, 45 සහ 47 වගන්තිවලට යටත් වේ. ඔවුන් අතරින් සාමාජිකයෙකු විධායක සභාපතිවරයා ලෙස පත් කිරීමට පනත යටතේ ඇමැතිවරයාට බලය ඇත. පනත මගින් සපයා ඇති පරිදි සභාපතිවරයා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි ප්‍රධාන විධායක නිලධාරියා වේ. 2019 දෙසැම්බර් 10 දිනැති අංක 2153/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් බෙදන ලද විෂයට අනුව 2021.12.31 දිනට පාලක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

<u>පනතේ 3(1) (අ) සිට (ජී) දක්වා වගන්ති යටතේ සිදු කරන ලද පත්වීම්</u>

1. මහාචාර්ය කපිල පෙරේරා මහතා, ලේකම්, අධ්‍යාපන හා තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශය
2. එම්.පී.ඩී.යූ.කේ.මාපා පතිරණ මහතා, ලේකම්, කම්කරු විෂය භාර අමාත්‍යාංශය
3. ජේ.ජේ. රත්නසිරි මහතා, ලේකම්, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය
4. මේජර් ජෙනරාල් ආචාර්ය එස්.එච්. මුණසිංහ මහතා, ලේකම්, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය
5. ජෙනරාල් දයා රත්නායක මහතා, ලේකම්, කාර්මික සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය
6. මහාචාර්ය උදිත් ජයසිංහ මහතා, ලේකම්, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය
7. අනුරාධ විජේකෝන් මහතා, ලේකම්, යෞවන කටයුතු විෂය භාර අමාත්‍යාංශය
8. බී.කේ.යූ.ඒ වික්‍රමසිංහ මහතා, සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
9. ආචාර්ය කේ.ඒ.ලලිතධීර මහතා, අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
10. මහාචාර්ය හරිශ්චන්ද්‍ර අබේගුණවර්ධන මහතා, සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
11. මහාචාර්ය සම්පත් අමරතුංග මහතා, සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
12. ටී නලින් ගම්ලත් මහතා, සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය
13. ජේ.ජී.ඩී. සේනානායක මිය, අධ්‍යක්ෂ (වැඩ බලන), රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිත

පනතේ 3(2) (O) වගන්තිය යටතේ සිදු කරන ලද පත් කිරීම

14. කේ.ආර්. උඩුවාවල මහතා, සභාපති (වැ.බ.), මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
15. පී රණේපුර මයා, විශ්‍රාමික ලේකම් (පත්කළ සාමාජික)
16. මහේෂ් කොටුවැල්ල මහතා, නීතීඥ (පත්කළ සාමාජික)
17. ආචාර්ය චතුරංග කැප්පෙටියාගම මයා, ආමාශ හා අන්ත්‍ර රෝග ශල්‍ය වෛද්‍ය (පත්කළ සාමාජික)
18. ආචාර්ය රනාලි පෙරේරා මිය, ඛනිජ තෙල් විශේෂඥ (පත්කළ සාමාජික)

පාලක සභාවේ සභා සාමාජිකයින්ගේ විස්තර - 2021

සභා සමාජිකයාගේ විස්තර		2021.07.13	2021.12.16
01.	කේ.ආර්. උඩුවාවල, සභාපති (වැඩ බලන), මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව	√	√
02.	මහාචාර්ය කපිල පෙරේරා, ලේකම්, අධ්‍යාපන හා තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශය	*	-
03.	එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ මයා, ලේකම්, කම්කරු විෂය භාර අමාත්‍යාංශය	√	-
04.	ජේ.ජේ. රත්නසිරි මයා, ලේකම්, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය	-	-
05.	ආචාර්ය (මේජර් ජනරාල්- විශ්‍රාමික) එස්.එච්. මුණසිංහ, ලේකම්, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය	√	-
06.	ජෙනරාල් දයා රත්නායක, ලේකම්, කාර්මික සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය	√	√
07.	මහාචාර්ය උදිත් ජයසිංහ, ලේකම්, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය	-	-
08.	අනුරාධ විජේකෝන් මයා, ලේකම්, යෞවන කටයුතු විෂය භාර අමාත්‍යාංශය	-	-
09.	බී.කේ.යූ.ඒ වික්‍රමසිංහ මහතා, සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	-	√
10.	ආචාර්ය කේ.ඒ.ලලිතධීර, අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	√	√
11.	මහාචාර්ය හරිශ්චන්ද්‍ර අබේගුණවර්ධන, සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	-	-
12.	මහාචාර්ය සම්පත් අමරතුංග, සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	√	√
13.	තරංග නලින් ගම්ලත් මයා, සභාපති, ජාතික ආධුනික, සහ කාර්මික පුහුණු අධිකාරිය	√	-
14.	ජේ.ජී.ඩී. සේනානායක මිය, අධ්‍යක්ෂ (වැඩ බලන), රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිත	√	√
15.	පී රණේපුර මයා, විශ්‍රාමික ලේකම් (පත්කළ සාමාජික)	√	√
16.	මහේෂ් කොටුවැල්ල මහතා, නීතීඥ (පත්කළ සාමාජික)	√	√
17.	ආචාර්ය චතුරංග කැප්පෙටියාගම, ආමාශ හා අන්ත්‍ර රෝග ශල්‍ය වෛද්‍ය (පත්කළ සාමාජික)	√	√
18.	ආචාර්ය රනාලි පෙරේරා මිය ඛනිජ තෙල් විශේෂඥ (පත්කළ සාමාජික)	√	√

සටහන: √ සහභාගී විය.

* නියෝජිතයෙක් සහභාගී විය.

- පැමිණ නැත.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සභා රැස්වීම් :

2021 ආරම්භයේ දී, හිටපු සභාපති පද්මසිරි ජයමාන්න මහතාගේ හදිසි අභාවය හේතුවෙන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සභාපති තනතුර පුරප්පාඩු විය. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 3(2) (O) වගන්තිය අනුව, ගරු රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් විසින් 2021 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි කේ.ආර්. උඩුවාවල මහතා සභාවේ වැඩ බලන සභාපති ලෙස පත් කර ඇත.

2021 වර්ෂයේදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සභා රැස්වීම් දෙකක් පවත්වන ලදී. 2021 දී සභාව විසින් සිදු කරන ලද කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත දැක්වෙන විශේෂ අවස්ථා දක්වා ඇත.

1. **"සෞභාග්‍යයේ සහ ආශ්චර්යයයේ දැක්ම" ට අනුකූලව මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම**

   නව මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් යාවත්කාලීන කිරීම සහ සකස් කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සැලැසුම් කෙටුම්පතක් (Blue Print) සකස් කර කවුන්සිලයට ඉදිරිපත් කොට ඇත.

2. **උපාධි යෝජනා ක්‍රම යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් ඵලදායී ලෙස යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනය**

   මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ අලුතින් පත් කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ඵලදායි ප්‍රයෝජනය පරීක්ෂා කිරීම සහ නිර්දේශ යෝජනා කිරීම හා මෙහි වැදගත්කම කවුන්සිලය සඳහන් කළේ ය.

3. **රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරි තනතුරු හිඟය අවම කිරීම සඳහා ගැටලු සහ විසඳුම්/ නිර්දේශ හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය**

   මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරී තනතුරුවල පවතින හිඟය සහ තාක්ෂණික නිලධාරී තනතුරු හිඟකම හේතුවෙන් බලපා ඇති ප්‍රධානතම වැදගත් සාධක හඳුනාගැනීමයි. වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දුන් අතර ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

4. **මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂඥ සංචිතයක්, කමිටු පිහිටුවීම හා උපදේශකයින් පත්කර ගැනීම**

   මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂඥ සංචිතයක්, කමිටු පිහිටුවීම හා උපදේශකයින් පත්කර ගැනීමට සභාව විසින් පියවර ගෙන ඇත. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මගින් සපයා ඇති පරිදි සහ අවශ්‍ය විටෙක ඔවුන්ගේ සේවය ලබා ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂඥ සංචිතයක්, කමිටු පිහිටුවීම සහ උපදේශකයින් පත් කරගැනීම මෙහි ප්‍රධාන අරමුණයි.

3. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන



4. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු:

තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව	**2021.12.31** දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව	**2021.12.31** දිනට පුරප්පාඩු සංඛ්‍යාව	නම
සභාපති	01	-	01	-
අධ්‍යක්ෂ	01	-	01	-
සහකාර අධ්‍යක්ෂ	03	02	01	ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය එස්.එස්. කළුආරච්චි මිය
සභා ලේකම්/නීති නිලධාරි	01	01	-	ජී.ජී. කසුනි උත්පලා මෙනවිය
පර්යේෂණ නිලධාරි	04	04	-	ඩී.සෙන්තිල්නාදන් මහතා එන්.ඩී එදිරිසිංහ මෙනවිය ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා යූ.එම්. වීරසේන මෙනවිය
පරිපාලන නිලධාරි	01	01	-	කේ.වී.එස්. එරංගා මිය
භාෂා පරිවර්තක	01	-	01	-
සංවර්ධන නිලධාරි	04	01	03	කේ.පී.පී. පෙරේරා මහතා
සභාපතිගේ පෞද්ගලික සහකාර	01	-	01	-
කළමනාකරණ සහකාර	08	05	03	සී.ආර්. මද්දගේ මහතා එම්.ජී.එන්. දිල්හාරි මිය කේ.සී මුතුමාල මෙනවිය ජී.එම්. සද්ධාමංගල මිය ආශා සුරේනි එදිරිසිංහ මිය
රියැදුරු	04	04	-	ජී.එම්. පින්නදූව මහතා ටෙරන්ස් පියල් මහතා ආර්.සී.ආර්. ජයවර්ධන මහතා ගයාන් ජීවන්ත මහතා
කාර්යාල සහායක	04	03	01	එන්.ජී. නදුන් මධුරංග මහතා ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා ඒ. නයනා ප්‍රියදර්ශනී මෙනවිය
මුළු එකතුව	**33**	**21**	**12**	

4.1 බඳවා ගැනීම් :

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිවිධාන අනුව සභාව සඳහා 33 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති නමුත් 2021.12.31 දිනට කාර්ය මණ්ඩලය 21 ක් විය. රජය විසින් බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් මෙම වසර තුළ කිසිදු බඳවා ගැනීමක් සිදු කර නොමැත. සිසිර කොඩිකාර මහතා 2021.04.08 දින සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලද අතර, ඔහු 2021.05.31 දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙන් ඉල්ලා අස්විය. ඒ සමඟම කේ. ආර්. උඩුවාවල මහතා 2021.06.21 දින සිට බල පැවැත්වෙන පරිදි වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සභාපති ලෙස පත් කරන ලදී.

4.2 ඉල්ලා අස්වීම් :

නම	තනතුර	ඉල්ලා අස් වූ දිනය
1. හිරුණි වමෝදි මෙනවිය	කළමනාකරණ සහකාර	2021.03.20
2. ආචාර්ය කේ.ඒ.ලලිතධීර මයා	අධ්‍යක්ෂ	2021.04.26

4.3 2021 වර්ෂය තුළ වැඩබලන / ආවරණ රාජකාරි සඳහා සභාව විසින් තෝරා පත් කරන ලද නිලධාරීන් :

නම	තනතුර	පත් කරන ලද දිනය
1. ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය	අධ්‍යක්ෂ (වැඩ ආවරණ)	2021.05.03

4.4 දේශීය පුහුණු හා විදේශීය පුහුණු :

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින්, සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ට දේශීය පුහුණුව ලබා දෙන ලදී. 2021 වර්ෂය තුළ පුහුණුවට සහභාගී වූ නිලධාරීන්ගේ විස්තර පහත පරිදි වේ.

පුහුණු වැඩසටහනේ විස්තර :

දිනය	පුහුණු වැඩසටහන	සම්පත් දායකයා	ආයතනය සහ තනතුර
2021/08/04	ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි	කේ.වී.ඒ.ඩී. විජේනායක මයා	හිටපු අධ්‍යක්ෂ- (මුදල්) (NIFNI)
2021/08/12	ධනාත්මක චින්තනය	මනෝජ් නදීෂාන් මයා	අධ්‍යක්ෂ (පරිපාලන) රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2021/08/18	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත	පියතිස්ස රණසිංහ මයා	හිටපු අධ්‍ය.ජ.- ජනමාධ්‍ය අමාත්‍යාංශය
2021/08/23	Zoom තාක්ෂණය යොදා ගැනීම	වනුජා චන්ද්‍රකුමාර් මිය	තොරතුරු තාක්ෂණ නිලධාරි රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2021/08/27	5S සංකල්පය	කේ.එන්.එස්. පෙරේරා මිය	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය
2021/08/30	එදිනෙදා ජීවිතය සඳහා නීතිය	මහේෂ් කොටුවැල්ල මයා	මා.ස.ස.ශ්‍රී.ලං.ජා.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ ජ්‍යෙෂ්ඨ නීතිඥ
2021/09/23	විදේශ අධ්‍යාපන අවස්ථා	එම්.එම්.ක්‍රිෂාන්ති මීගහපොල මිය	අධ්‍යක්ෂ - (විදේශ අධ්‍යාපනය) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2021/09/30	මූලික අයිතිවාසිකම් සහ නීතිය	මහේෂ් කොටුවැල්ල මයා	මා.ස.ස.ශ්‍රී.ලං.ජා.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ ජ්‍යෙෂ්ඨ නීතිඥ
2021/10/26	ඊමේල් ආචාර විධි පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය	ලලිත් වඩුගේ මයා සහ ඉරේෂා බණ්ඩාරනායක මිය	අධ්‍යක්ෂ -(IT) අධ්‍යාපන අමාත්‍යාංශය, තො.තා නිලධාරි- අධ්‍යාපන අමාත්‍යාංශය
2021/11/24	සාර්ථක වෘත්තීය ජීවිතයක් සඳහා මනෝවිද්‍යාත්මක වෘත්තීය මාර්ගෝපදේශනය	එල්.එල්.එච්. තිලකරත්න මයා	අතිරේක ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය
2021/12/01	පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය	මහාචාර්ය නාලක ජයකොඩි	උපකුලපති, Saegis Campus
2021/12/30	ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම	ශාලික පෙරේරා මිය සහ කුමුදුනී දංගල්ල මිය	ඵලදායිතා නිලධාරී, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

4.5. විගණන සහ කළමනාකරණ කමිටුව - 2021

විගණන සහ කළමනාකරණ කමිටුව 2021 දී, අවස්ථා දෙකක දී රැස්වූ අතර පහත කරුණු සම්බන්ධයෙන් කළමනාකාරීත්ව තීරණ සභාවට නිර්දේශ කරන ලදී.

- ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය - 2020
- තථ්‍ය මූල්‍ය තත්ත්වය - 2020
- වාර්ෂික වාර්තා කෙටුම්පත - 2020
- සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම - 2021
- අයවැය ප්‍රතිපාදන - 2022
- ක්‍රියාකාරී සැලැස්ම - 2022
- ප්‍රසම්පාදන සැලැස්ම - 2022
- සභාවේ පරිපාලනයට අදාළ විවිධ කළමනාකරණ තීරණ

2021 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා විගණන සහ කළමනාකරණ කමිටුව සභාවේ පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

- **2021 මාර්තු 09 - 1 වන රැස්වීම**
  1. ජේ.ඩී.ජී. සේනානායක මිය, අධ්‍යක්ෂ (වැඩ බලන) - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව - කමිටු සභාපති
  2. ආර්.එච්. පියසේන මයා - (සභා සාමාජික) – කමිටු සාමාජික
  3. ජානක ජයලත් මයා, අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන)/ TVEC – කමිටු සාමාජික
  4. ඕ.පී.ආර්. දමයන්ති මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය – නිරීක්ෂක
  5. එල්.ඒ.ජී.එස්. ගුණසේකර මිය, විගණන අධිකාරී, රාජ්‍ය විගණන අංශය – නිරීක්ෂක

- **2021 දෙසැම්බර් 02 – 2 වන රැස්වීම**
  1. ජේ.ඩී.ජී. සේනානායක මිය, අධ්‍යක්ෂ (වැඩ බලන) - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව- කමිටු සභාපති
  2. ආර්.එච්. පියසේන මයා - (සභා සාමාජික) – කමිටු සාමාජික
  3. ආචාර්ය කේ.ඒ.ලලිතධීර, අධ්‍යක්ෂ ජනරාල්, TVEC – කමිටු සාමාජික
  4. ඕ.පී.ආර්. දමයන්ති මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක– රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය – නිරීක්ෂක
  5. එල්.ඒ.ජී.එස්. ගුණසේකර මිය, විගණන අධිකාරී, රාජ්‍ය විගණන අංශය – නිරීක්ෂක

5. 2021 වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති

5.1 2020/21 උපාධි යෝජනා ක්‍රමය යටතේ පත් කරන ලද සංවර්ධන නිලධාරීන් ඵලදායී ලෙස යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනය

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය අංශය ආර්ථික සංවර්ධනය සඳහා පදනම් වන ප්‍රධාන අංගයකි. එබැවින්, සෑම රජයක්ම තම රාජ්‍ය අංශය ඉහළ නිපුණතාවයකින් සහ පූර්ණ ලෙස යොදවා ගන්නා ලද සේවකයින්ගෙන් සමන්විත වන බවට වග බලා ගත යුතු ය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සංවර්ධන නිලධාරී තනතුරුවලට ඇතුළත් වීමට මූලික සුදුසුකම වන්නේ මූලික විශ්වවිද්‍යාල උපාධිය හෝ උසස් ජාතික ඩිප්ලෝමාවයි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය උපාධිධාරීන් සහ උසස් ජාතික ඩිප්ලෝමා දරන්නන් සැලකිය යුතු ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනිමින් සිටී. රජය සහ විශ්ව විද්‍යාල විසින් බොහෝ මුලපිරීම් ගෙන ඇතත්, උපාධිධාරීන්ගේ සහ උසස් ජාතික ඩිප්ලෝමා දරන්නන්ගේ විරැකියාව දේශපාලන, ආර්ථික සහ සමාජීය සාකච්ඡාවල දී පොදු මාතෘකාවකි.

2011.12.21 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වැඩසටහන් නිලධාරීන්ගේ සේවය 2012.02.14 දිනැති අංක 1745/11 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලදී. රැකියා විරහිත උපාධිධාරීන් 2011 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ ආයතනවලට වැඩසටහන් නිලධාරීන් ලෙස අනුයුක්ත කරන ලදී.

2012.02.14 දිනැති අංක 1745/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ‘‘වැඩසටහන් නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව’’ ලෙස ද ප්‍රකාශයට පත් කරන ලද සේවා ව්‍යවස්ථා නාමය "සංවර්ධන නිලධාරි සේවය" නමින් ද ‘‘වැඩසටහන් නිලධාරි’’ ලෙස තනතුර සඳහන් කරන ඕනෑම තැනක් සඳහා "සංවර්ධන නිලධාරි" යන තනතුර ද 2012/09/05 දිනැති අංක 1774/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරන ලදී.

අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ 2020/2021 උපාධි යෝජනා ක්‍රමයෙන් අලුතින් පත් කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ (DO) කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ඵලදායී ප්‍රයෝජනය පරීක්ෂා කිරීම සහ නිර්දේශ යෝජනා කිරීමයි.

අධ්‍යයනයේ නිශ්චිත අරමුණු:

- නව පත්වීම් සමඟින් අත්දැකීම් ක්ෂේත්‍රයේ ඇති සම්බන්ධය අධ්‍යයනය කිරීම.
- අධ්‍යාපන සුදුසුකම් සහ නව පත්වීම් අතර ඇති සම්බන්ධය හඳුනා ගැනීම.
- සංවර්ධන නිලධාරීන් විසින් තම සේවා සැපයීමේ දී මුහුණ දෙන බාධක සහ අභියෝග හඳුනා ගැනීම.
- රැකියා භූමිකාව ඉටු කිරීම සඳහා ලබා දෙන පුහුණුවේ සඵලතාවය හඳුනා ගැනීම.
- කාර්ය සාධනය ඇගයීමේ සඵලතාවය සමාලෝචනය කිරීම.
- සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ යෝජනා කිරීම.

මෙම අධ්‍යයනයේ දී නියැදිය තෝරා ගැනීම සඳහා සරල අහඹු නියැදී ක්‍රමය භාවිතා කරන ලදී. රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දත්තවලට අනුව, 2020/2021 උපාධි යෝජනා ක්‍රමය යටතේ බඳවාගත් කොළඹ දිස්ත්‍රික්කයේ මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 3470 ක් වන අතර ඔවුන් විවිධ ආයතනවලට අනුයුක්තව සේවය කරමින් සිටිති. Morgan ගේ වගුව භාවිතා කරමින් නියැදියේ අවම ප්‍රමාණය තීරණය කර ඇත්තේ දෝෂයේ ආන්තිකයේ 5% සහ 95% විශ්වාසනීය මට්ටම සලකා බැලීමෙනි. එබැවින් සමීක්ෂණයේ නියැදියේ තරම හාරසියයකි.

උපාධි යෝජනා ක්‍රමයේ බඳවාගත් මුළු උපාධිධාරීන් සංඛ්‍යාව ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 25ම ආවරණය කිරීමට මුල දී අධ්‍යයනය සැලසුම් කර තිබුණි. එහෙත්, රටේ පැවති COVID-19 තත්ත්වය හේතුවෙන්, අධ්‍යයනය කොළඹ දිස්ත්‍රික්කයට සීමා කිරීමට සිදු විය.

නියැදියෙන් දත්ත රැස් කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සම්බන්ධීකරණ නිලධාරීන් නම් කරන ලද අතර ඔවුන් හරහා ප්‍රශ්නාවලි බෙදා හැරීම සහ එකතු කිරීම සිදු කරන ලදී. 2021 දෙසැම්බර් 31 වන දින වන විට, දත්ත සමුදායට දත්ත ඇතුළත් කිරීම සිදු කරන ලද අතර මෙම අධ්‍යයනය 2022 වසර වන විට අවසන් කිරීමට නියමිතය.

5.2 රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය අවම කිරීම සඳහා ගැටළු හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය

තාක්ෂණික ශ්‍රේණියේ නිලධාරීන් යනු ආයතනවල විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට සහය දක්වන බහු කාර්ය ස්වභාවයේ ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරණ රාජ්‍ය අංශයේ සේවා කාර්ය මණ්ඩලය වේ. රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇති තාක්ෂණික ශ්‍රේණියේ තනතුරු (තාක්ෂණික නිලධාරීන් සඳහා විශේෂ යොමු කිරීමක් සහිතව) සැලකිය යුතු ප්‍රමාණයක් පුරප්පාඩු වී තිබීම රාජ්‍ය අංශයේ ආයතනවල ඵලදායී සේවා සැපයීමට විශාල බාධාවක් වී ඇත. දැනට පවතින හිඟය, තාක්ෂණික නිලධාරීන් තනතුරු හිඟය වැඩිවීමට බලපෑ ප්‍රධාන සාධක සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරීන් හිඟය අවම කිරීම සඳහා වන නිර්දේශ හඳුනාගැනීම සඳහා විශේෂඥ කමිටුවක් පත්කර ඒ හරහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මූලිකව, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 1977 වර්ෂයේ දී අතරමැදි මට්ටමේ ඒකාබද්ධ තාක්ෂණික සේවාව ලෙස ස්ථාපිත කරන ලද අතර 1994.07.01 දින ශ්‍රී ලංකා තාක්ෂණික සේවය ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. අනතුරුව, 2006 දී ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ගැටලු විසඳීම සඳහා තාක්ෂණික සේවා මණ්ඩලය පිහිටුවන ලදී. පසුව තාක්ෂණ සේවා මණ්ඩලය අහෝසි කර ශ්‍රී ලංකා තාක්ෂණික සේවා අංශය ඇති කරන ලදී. ඒ සමගම, උපදේශක කමිටුවක් පත් කර ඇති අතර, උපදේශන කමිටුවේ අදහස් විමසීමෙන් පසු තාක්ෂණික

නිලධාරීන් (බඳවාගැනීම් වැනි) පිළිබඳ අවශ්‍ය තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෑම ආයතනයක් සඳහාම පත්කිරීමේ අධිකාරියට අනුමැතිය ලබාදී ඇත.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවය යටතේ රැකියා කාණ්ඩ 159ක් පමණ හඳුනාගෙන ඇති නමුත් වත්මන් අධ්‍යයනයෙන් අවධානය යොමු කර ඇත්තේ MN-03, MN-07 යන වැටුප් කේතය සහිත ‘‘තාක්ෂණික නිලධාරි’’ සහ මෙම තක්සේරුව සඳහා සිවිල්, යාන්ත්‍රික සහ විදුලි විශේෂඥ ක්ෂේත්‍රය වෙත පමණි.

අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, විශ්ලේෂණාත්මක අරමුණ සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත එක් රැස් කරන ලදි. රාජ්‍ය අංශයට අයත් ව්‍යවසායන්හි (SOEs) සිටින තාක්ෂණික නිලධාරීන් සම්බන්ධ සේවක සංඛ්‍යා තොරතුරු නොමැති වීම හේතුවෙන්, මෙය ගණනය කිරීම සඳහා හරිත මධ්‍යයන ක්‍රමය භාවිතා කරන ලදි. ප්‍රාථමික දත්ත රැස් කිරීම යටතේ, මා.ස.ස.ශ්‍රී.ලං.ජා.ස පර්යේෂණ කණ්ඩායම විසින් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව 2014 වසරේ සමත් වූ සිසුන්ගෙන් අහඹු ලෙස තෝරාගත් නියැදියකින් ව්‍යුහගත දුරකථන සමීක්ෂණයක් පවත්වා ප්‍රතිචාර 89ක් රැස් කර ඇත.

අධ්‍යයනය විශ්ලේෂණය කිරීමේ දී පෙනී ගියේ අධ්‍යයන කාලය තුළ පළාත් සභා පද්ධතිය, මධ්‍යම රාජ්‍ය පද්ධතිය සහ රාජ්‍ය ව්‍යවසායන්හි පිළිවෙළින් තාක්ෂණික නිලධාරීන් පුරප්පාඩු 941, 646 සහ 1,024 ක් පවතින අතර, සියල්ල එක්ව 2019 වසර අවසානය දක්වා රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරීන් පුරප්පාඩු 2,611 ක් පවතින බවයි. නමුත් තාක්ෂණික නිලධාරීන් සැපයීම සලකා බැලීමේ දී 2019 වසරේ තාක්ෂණික ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් ලැබූවන් ලෙස සිසුන් 2500ක් පමණ සමත් වූ අතර නියැදි සමීක්ෂණයට අනුව සමත් වූ සිසුන් අතරින් රාජ්‍ය අංශයේ නියැලී සිටියේ සියයට 13ක් පමණ වන ප්‍රතිශතයකි.

දුරකථන ඇමතුම් සිදුකල සමීක්ෂණයට අනුව, තාක්ෂණික නිලධාරීන් සැපයීමේ ආධිපත්‍ය පුරුෂ පාර්ශ්වය විසින් දරණ බව අධ්‍යයනයෙන් හඳුනාගෙන ඇති අතර, එහිදී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 71 ක් පිරිමින් වූ අතර වැඩිම ප්‍රතිචාර දැක්වූවන් සංඛ්‍යාව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අයවලුන් විය. ප්‍රතිචාර දැක්වූ පිරිසගෙන් බහුතරය (89%) අධ්‍යයන කාලය තුළ සේවයේ යෙදී සිටි තැනැත්තන් ය.

පුද්ගලික අංශයේ තාක්ෂණික ශ්‍රේණියේ තනතුරුවලට සම්බන්ධ වීමට බලපෑ ප්‍රබලම සාධකය වූයේ ‘‘රාජ්‍ය අංශයට වඩා පුද්ගලික අංශයේ පැවති අවස්ථා ප්‍රමාණය අධික වීම සහ නියැලීමේ පහසුව’’ යි. දැනට පෞද්ගලික අංශයේ සේවයේ නියුතු තාක්ෂණික නිලධාරීන්ගෙන් බහුතරයක් අනාගතයේ දී රාජ්‍ය අංශයට සම්බන්ධ වීමට කැමැත්තක් නොදක්වන නමුත් ඒ සමඟම තාක්ෂණික නිලධාරීන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (39%) සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටිති. මෙහිදී වඩාත් සිත්ගන්නා කරුණ නම් ‘‘රැකියා සුරක්ෂිතතාව’’ අනාගතයේ දී රාජ්‍ය අංශයට සම්බන්ධ වන පුද්ගලයින්ට වඩාත්ම බලපාන සාධකය වන අතර එය දැනට රාජ්‍ය අංශයේ සේවයේ නියුතු තාක්ෂණික නිලධාරීන් සඳහාම වීමයි. සියලුම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන්, අධ්‍යයනය ගැටළු කිහිපයක් සහ විභව නිර්දේශ හඳුනාගෙන ඇත.

ප්‍රධාන ගැටළු සහ නිර්දේශ පහත පරිදි වේ:

ගැටළුව	නිර්දේශ
රාජ්‍ය අංශයේ තාක්ෂණික තනතුරුවලට අන්තර්ග්‍රහණය කර ගැනීමට සුදුසුකම් ලත් පුද්ගලයන් ප්‍රමාණවත් නොවීම සහ පුහුණුවන්නන් සේවයේ රඳවා ගැනීමේ අපහසුතාව.	ඉල්ලුමට අනුව පවතින පහසුකම් භාවිතා කරමින් පුහුණු ධාරිතාව පුළුල් කිරීම සහ පළාත් නවයම ආවරණය වන පරිදි වෘත්තීය ඩිප්ලෝමා ප්‍රදානය (විදුලි, යාන්ත්‍රික සහ සිවිල් ඉංජිනේරු) රාජ්‍ය හා පෞද්ගලික තාක්ෂණික පුහුණු ආයතන පිහිටුවීම.
රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරීන්ගේ දැනට පවතින සේවක සංඛ්‍යාව හඳුනා ගැනීම සඳහා මධ්‍යගත තොරතුරු පද්ධතියක්/හෝ දත්ත සමුදායක් සංවර්ධනය කර නොමැති වීම.	මධ්‍යම, පළාත් ආණ්ඩු සහ රාජ්‍ය ව්‍යවසායන්හි තාක්ෂණික නිලධාරීන්ට අදාළ සියලු තොරතුරු සම්බන්ධ කිරීම සඳහා මධ්‍යගත දත්ත සමුදායක් ස්ථාපිත කර එය අවම වශයෙන් වාර්ෂිකව යාවත්කාලීන කිරීම
රාජ්‍ය අංශයේ තාක්ෂණික ක්ෂේත්‍ර රැකියා සඳහා කාන්තා සහභාගිත්වය ඌනවීම	තාක්ෂණික නිලධාරීන්ගේ තනතුරුවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් ඇතුළත් කර ගැනීම අවධාරණය කිරීම.
අලුතින් සමත් වන සිසුන් සඳහා රාජ්‍ය අංශයේ තාක්ෂණික නිලධාරී තනතුරු සොයා ගැනීමේ අපහසුව	රාජ්‍ය අංශයේ අදාළ ආයතන ප්‍රධානීන් අදාළ තාක්ෂණික පුහුණු ආයතන සමඟ සම්බන්ධතාවක් පවත්වා ගනිමින් එක් එක් තාක්ෂණික පුහුණු ආයතනවලින් සමත් වූ සිසුන් වහාම රැකියාගත පුහුණුවන්නන්(OJT) ලෙස අන්තර්ග්‍රහණය කර ගැනීමට බඳවා ගැනීමේ කාලසීමාව සැලසුම් කිරීම

5.3 ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (NHRDP) සැකසීම

1997 අංක 18 දරණ ජාතික මානව සම්පත් සංවර්ධන සභා පනතේ 14(i) වගන්තිය ප්‍රකාරව, සභාවේ වගකීම් සහ කාර්යභාරය වනුයේ සේවා නියුක්තිය, පුහුණුව සහ අධ්‍යාපනය සම්බන්ධ හෝ ඊට අදාළ ආංශික මානව සම්පත් සංවර්ධනය තාර්කිකකරණය සහ සම්බන්ධීකරණය, විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, අවාසිකර පුද්ගල කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණය සැලසුම් කිරීම, සහ ආර්ථික ප්‍රතිසංස්කරණ සමඟ හිමිකම් පවත්වා ගැනීම ඇතුළුව ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට එහි සෑම අංශයකින්ම උපදෙස් ලබා දීමයි.

රජයේ නව දැක්ම වන ‘‘සෞභාග්‍යයේ සහ ආශ්චර්යයේ දැක්ම’’ යටතේ ආවරණය වන විෂය ක්ෂේත්‍රය අනුව සමඟ සමපාත වන ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම වහා අවශ්‍ය වේ. ඒ අනුව, ‘‘සෞභාග්‍යය සහ ආශ්චර්යයේ දැක්ම’’ යටතේ එන ප්‍රධාන ප්‍රතිපත්ති දහය සඳහා වගකිව යුතු සෑම ආයතනයකම අනුමැතිය ඇතිව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව එකී ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියෙහි ඉලක්ක/අරමුණු :

සේවා නියුක්තිය :

1. ශ්‍රී ලංකාවේ සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ, ඵලදායී සහ නිදහසේ තෝරාගත් රැකියාවක් හිමිකර ගැනීම ප්‍රවර්ධනය කිරීම
2. ඒක පුද්ගල ආදායම වැඩි කිරීම සහ දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහනය අඩු කිරීම තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම
3. භේදයකින් තොරව සෑම සේවකයෙකුටම හැකි උපරිම රැකියා අවස්ථා ලබාදීම

අධ්‍යාපනය සහ පුහුණුව :

1. ඉහළ නිපුණතාවයන් සහිත, ගෝලීය වශයෙන් තරඟකාරී, බහු නිපුණතාවන්ගෙන් සපිරි ඵලදායී ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම
2. දූෂණයෙන් තොර අධ්‍යාත්මිකව දියුණු, පරිසර හිතකාමී සහ සදාචාර සම්පන්න සමාජයක් ඇති කිරීම.
3. ළමුන් සහ තරුණයින් හානිකර මත්ද්‍රව්‍ය වලින් ආරක්ෂා කිරීම සඳහා නිසි නිරීක්ෂණ සහ පරීක්ෂණ යාන්ත්‍රණයක් සහතික කිරීම.

ජනතා - කේන්ද්‍රීය ආර්ථිකය :

1. වර්තමාන සහ අනාගත පරම්පරාවේ යහපත සඳහා ආර්ථික සංවර්ධනයේ සාකල්‍ය ප්‍රවේශයක් නිර්මාණය කිරීම
2. ආර්ථික ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

සමාජ ආරක්ෂණය සහ හිමිකම් :

1. කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන්, වෙනස් හැකියාවන් ඇති සහ අවාසි සහගත කණ්ඩායම්වල මූලික අයිතිවාසිකම් සහ අවශ්‍යතා සුරක්ෂිත කිරීම.
2. සයිබර් හිරිහැර කිරීම් වලින් පුරවැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීම.

විද්‍යා තාක්ෂණය සහ නවෝත්පාදන :

1. තාක්ෂණය මත පදනම් වූ සමාජයක් සඳහා ශ්‍රී ලංකාවේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම
2. ආන්තික ප්‍රජාවන් සහ අවදානමට ලක්විය හැකි පරිශීලකයින් සඳහා ඩිජිටල් සේවා සැපයීම සහතික කිරීම (ආබාධිත පුද්ගලයින් වැනි)
3. නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ ඉහළ ඵලදායිතාව සඳහා බුද්ධිමය දේපළ අයිතිවාසිකම් භාවිතා කිරීම.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි යෝජිත පංචවිධ කුළුණු

1. සේවා නියුක්තිය
2. අධ්‍යාපනය සහ පුහුණුව
3. මහජන කේන්ද්‍රීය ආර්ථිකය
4. සමාජ ආරක්ෂණය සහ හිමිකම්
5. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන

අප සභාව මගින් දැනටමත් උපදේශන කමිටුවක් සහ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් නම් කර ඇති අතර මෙම කමිටු හරහා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීමට බලාපොරොත්තු වේ. එම ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු මානව සම්පත් ප්‍රතිපත්තිය ජාතික වශයෙන් සහ උප ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කෙරේ. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් අදාළ සියලුම අංශ ආවරණය වන පරිදි සැලසුම් කෙටුම්පතක් (Blue Print) සකස් කර ඇත.(1 රූපය)

ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියේ සැලැසුම් කෙටුම්පත (Blue Print)

මෙම සැලැස්ම සකස් කිරීමේ දී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනත යටතේ එන විෂයය ක්ෂේත්‍ර, තිරසාර සංවර්ධන ඉලක්ක, NHR සහ E ප්‍රතිපත්තියේ පංච විධ ස්තම්භයන් සහ "සෞභාග්‍යය සහ ආශ්චර්යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව යටතට ගැනෙන නව විධ ස්තම්භයන් සැලකිල්ලට ගන්නා ලදී.

COVID-19 වසංගතය සහ පවතින සෞඛ්‍ය සීමාවන් හේතුවෙන් විශේෂඥ කණ්ඩායම භෞතිකව එක්රැස් වීමට බාධාවක් වී පැවැතුණි.



1 රූපය : සැලැසුම් කෙටුම්පත (Blue Print)

5.4 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි දැක්මට අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අදාළ පාර්ශවකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම සඳහා වාර්ෂිකව සංඛ්‍යාලේඛන අත්පොතක් පළ කිරීමට තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් 2015 වසරේ සිට අත්පොත් හතරක් ප්‍රකාශයට පත් කර ඇති අතර නවතම ප්‍රකාශය 2021 වසරේ ප්‍රකාශයට පත් කර ඇත.

මෙම ප්‍රකාශනයේ සාමාන්‍ය අධ්‍යාපනය, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අංශ සම්බන්ධ වැදගත් සංඛ්‍යාලේඛන ඇතුළත් වේ. වෙබ් අඩවියේ ඇති ද්විතීයික දත්ත මූලාශ්‍ර, ශ්‍රී ලංකාවේ මහ බැංකු වාර්ෂික වාර්තා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන ආදිය මත පදනම්ව සියලුම දත්ත එක් රැස් කර ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙහි අඩංගු දත්ත වැදගත් වනු ඇත.

6. 2021 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සිදුකරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන :

ප්‍රකාශනවල පින්තූර සහ 2021 වර්ෂය තුළ පළ කරන ලද වාර්තා පහතින් දැක්වේ.



රාජ්‍ය කාර්මික නිලධාරීන් පිළිබඳ අධ්‍යයනය



සංඛ්‍යාන අත්පොත 2021



මානව ප්‍රාග්ධන සඟරාව

7. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී.ල.රු

	සටහන		2021		2020		අයවැයගත
වත්කම්							
ජංගම වත්කම්							
මුදල් හා මුදලට සමාන දෑ	1		17,517,904.58		17,476,958.89		17,500,000.00
ලැබිය යුතු	2		40,062.82		40,062.82		41,000.00
භාණ්ඩ තොග	3		1,080,696.56		788,136.66		1,100,000.00
පෙර ගෙවීම්	4		82,975.65		84,468.92		85,000.00
අනෙකුත් ජංගම වත්කම්	5		3,034,602.61		3,319,639.45		3,400,000.00
			21,756,242.22		**21,709,266.63**		**22,126,000.00**
ජංගම නොවන වත්කම්							
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ	6		8,412,437.23		9,950,577.86		9,000,000.00
මෝටර් රථ	6		-		1,449,060.65		-
මෘදුකාංග			118,148.33		221,400.83		200,000.00
වෙනත් මූල්‍ය නොවන වත්කම්	6		545,297.98		418,540.63		500,000.00
			9,075,883.54		12,039,579.97		9,700,000.00
